(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 10]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2008 ජූලි මස 22 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0025/'08

1.

ගරු රවි කරුණානායක මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර 15ක කාලය තුළ අයවැය පරතරය කොපමණද;

(ii) අයවැය ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ ඇස්තමේන්තුගත කර තිබූ මුදලට සාපේක්ෂව අය වැය පරතරය කොපමණද;

(iii) පසුගිය වසර 15 ඇතුළත මුළු අයවැය හිඟය හා මුළු දේශීය හා විදේශීය ණය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අදාල වර්ෂවල ඇස්තමේන්තුගත මුදලට සාපේක්ෂව අයවැය පරතරයට හේතුව කුමක්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0027/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉහළ කොත්මලේ විදුලි බලාගාරය ඉදි කිරිම හා එහි වැඩ අවසන් කිරීමට බලාපොරොත්තු වන්නේ කවදාද;

(ii) ව්‍යාපෘතිය ආරම්භයේදී එහි පිරිවැය හා මේ වනවිට එහි පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා මුදල් ලබා ගන්නා රට හෝ ආයතනය කුමක්ද; සහ

(iv) එම ණය ලබා දීමේ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අවප්‍රමාණ වීමත් ඇතුළුව, ඒකකයක් සඳහා වන පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0028/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 අප්‍රේල් මස 02 වැනි දින සිට මේ දක්වා කාලය තුළ පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, උඳුන් තෙල් හා ගුවන් යානා ඉන්ධන වල මිල වැඩිවූ දින කවරේද;

(ii) පෙට්‍රල් සඳහා එකතු කළ අගය මත බද්දෙහි (වැට්) ප්‍රතිශතය කොපමණද;

(iii) ලීටරයක් සඳහා ඉහත අගය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂය සඳහා එක් එක් ඛනිජ තෙල් නිෂ්පාදනය වෙනුවෙන් අය කළ සම්පූර්ණ බදු ප්‍රමාණය කොපමණද;

(ii) මෙම ආදායම භාවිතා කර ඇත්තේ කවර කටයුත්තක් සඳහාද;

(iii) සියලුම බදු වර්ග අහෝසි කළහොත්, පෙට්රල්, ඩීසල්, භූමිතෙල්, උඳුන්තෙල් හා ගුවන් යානා ඉන්ධනවල මිල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බදු වැඩි කිරීම මගින් මාර්ගවල තත්ත්වය දියුණු කිරීමට බලාපොරොත්තු වූ බවත්;

(ii) බදු පැනවීමෙන් පසුව මාර්ගවල තත්ත්වය තවත් අයහපත් වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම් එවැනි බදු පැනවීමේ අරමුණ කුමක්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0337/'08

4.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය ස්ථාපිත කර ඇත්තේ රජයේ ගොඩනැගිල්ලකද, නොඑසේ නම් පෞද්ගලික අයිතිකරුවෙකු සතු ගොඩනැගිල්ලකද;

(ii) පෞද්ගලික අයිතිකරුවෙකු සතු ගොඩනැගිල්ලක නම්, එහි අයිතිකරුගේ නම කවරේද;

(iii) එම ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය සහ මාසික කුලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) අදාළ අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතන කවරේද;

(ii) එම ආයතන පිහිටා ඇත්තේ කවර ස්ථානවලද;

(iii) එම ආයතන පිහිටා ඇති ගොඩනැගිලි රජයට අයත්වේද නැතහොත් පෞද්ගලික අයිතිකරුවන්ට අයත්වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පෞද්ගලික අයිතිකරුවන් සතු ගොඩනැගිලිවල පවත්වාගෙන යන ආයතන කවරේද;

(ii) එම ගොඩනැගිලිවල අයිතිකරුවන් කවුරුන්ද;

(iii) අදාළ ගොඩනැගිලිවල වර්ග ප්‍රමාණය සහ මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0338/'08

5.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය ස්ථාපිත කර ඇත්තේ රජයේ ගොඩනැගිල්ලකද, නොඑසේ නම් පෞද්ගලික අයිතිකරුවෙකු සතු ගොඩනැගිල්ලකද;

(ii) පෞද්ගලික අයිතිකරුවෙකු සතු ගොඩනැගිල්ලක නම්, එහි අයිතිකරුගේ නම කවරේද;

(iii) එම ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය සහ මාසික කුලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) අදාළ අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතන කවරේද;

(ii) එම ආයතන පිහිටා ඇත්තේ කවර ස්ථානවලද;

(iii) එම ආයතන පිහිටා ඇති ගොඩනැගිලි රජයට අයත්වේද නැතහොත් පෞද්ගලික අයිතිකරුවන්ට අයත්වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පෞද්ගලික අයිතිකරුවන් සතු ගොඩනැගිලිවල පවත්වා ගෙන යන ආයතන කවරේද;

(ii) එම ගොඩනැගිලිවල අයිතිකරුවන් කවුරුන්ද;

(iii) අදාළ ගොඩනැගිලිවල වර්ග ප්‍රමාණය සහ මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0339/'08

6.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ග්‍රාමීය කර්මාන්ත හා ස්වයංරැකියා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දීර්ඝ කාලීන පාරම්පරික ඉතිහාසයක් ඇති දේශීය පිත්තල කර්මාන්තය, දෙනුවර ප්‍රදේශවාසීන්ගේ ප්‍රධාන ජීවනෝපාය බවත්;

(ii) ලක්ෂ තුනකට (03) අධික සංඛ්‍යාවක් මෙම කර්මාන්තයේ ප්‍රතිලාභ ලබන බවත්;

(iii) මේ වනවිට මෙම කර්මාන්තයට අභාග්‍ය සම්පන්න තත්ත්වයක් උදාවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම කර්මාන්තයට ප්‍රධාන වශයෙන් යොදා ගන්නා තඹ, පිත්තල, තුත්තනාගම් සහ ඇලුමිනියම් කුට්ටිකර වැඩි මිලකට ඉන්දියාවට අපනයනය කිරීම නිසා දේශීය පිත්තල කර්මාන්තයේ මෙම අමුද්‍රව්‍යවල හිඟයක් පවතින බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මෙම අමුද්‍රව්‍ය කුට්ටිකර ඉන්දියාවට අපනයනය කිරීම වහාම නතරකර දේශීය කර්මාන්තය රැක ගැනීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0393/'08

7.

ගරු අචල ජාගොඩගේ මහතා,— ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය තුළ එතුමාගේ අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0394/'08

8.

ගරු අචල ජාගොඩගේ මහතා,— ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය තුළ එතුමාගේ අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0395/'08

9.

ගරු අචල ජාගොඩගේ මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය තුළ එතුමාගේ අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0442/'08

10.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා එම අමාත්‍යාංශයේ වාහන භාවිතා කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ සංඛ්‍යාවක්ද;

(iii) පසුගිය මාස අටක කාලය තුළ ඉන්ධන සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0443/'08

11.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල කඩේවැල්ල නමින් ධීවර තොටුපලක් තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ධීවර තොටුපල අවහිර වන ලෙස පස්වලින් ගොඩකිරීම් සිදුකරන්නේ කවර පාර්ශ්වයක් විසින්ද;

(ii) අදාළ ගොඩකිරීම් සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය ලබා දී තිබේද;

(iii) එසේනම් අදාළ අවසරය ලබා දී ඇති දිනය සහ ඒ කවර නීතිරීති යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත ගොඩකිරීම් සහ ඉදිකිරීම් නිසා ධීවරයින්ට තම වෘත්තිය කරගෙන යාමට නොහැකි වී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ධීවරයින්ට තම වෘත්තීය කරගෙන යාමට හැකිවන ලෙස එකී ගොඩකිරීම් සහ ඉදිකිරීම් නතර කිරීමට පියවර ගන්නේද;

(ii) ඒ කවර කාල පරාසයක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0444/'08

12.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර 10 ඇතුළත ධීවර වරායන් සහ නැංගුරම් පොලවල් ඉදිකිරීම සඳහා තබන ලද මුල්ගල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර ස්ථානවලද;

(iii) මේ වන විට ඉදිකර ඇති වරායන් හා නැංගුරම් පොලවල් සංඛ්‍යාව සහ අදාළ ස්ථාන කවරේද;

(iv) මෙම වරායන් සහ නැංගුරම් තොටුපලවල ඉදිකිරීම් කටයුතු අවසන් කළේ කවදාද; සහ

(v) එම ඉදිකිරීම් කටයුතු සිදුකළේ කවර ආයතනය විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0488/’08

13.

ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රතිනිර්මාණ හා සංවර්ධන නියෝජිතායතනය (RADA) ආරම්භ කරනු ලැබුවේ කවදාදා;

(ii) ඒ කවර නෛතික පදනමක් මතද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ආයතනයේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරීන් ඇතුලු මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ තනතුරු, අධ්‍යාපන සුදුසුකම්, වැටුප් හා දීමනා සහ බඳවා ගනු ලැබූ පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එම ආයතනයෙන් භාවිත කිරීම සඳහා ලබාදී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ ප්‍රධාන නිලධාරීන් සඳහා ඉහත වාහන වෙන්කර ඇති ආකාරය වාහනයේ වර්ගය සහ අංකය කවරේද;

(iii) එම වාහන කුලී, කොන්ත්‍රාත් හෝ වෙනත් කවර හෝ ආකාරයකට ලබාගත්තේ නම්, ඒවා ලබාගත් පදනම සහ එම එක් එක් වාහනය සඳහා වැයකරනු ලැබූ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0489/’08

14.

ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රතිනිර්මාණ හා සංවර්ධන නියෝජිතායතනය (RADA) සඳහා 2006 සහ 2007 වර්ෂවල වෙන්කරන ලද සමස්ත මුදල් ප්‍රමාණය කොපමණද,

(ii) එම මුදල් වෙන්කරන ලද්දේ මහා භාණ්ඩාගාරයෙන් පමණක්ද ;

(iii) වෙනත් කවර හෝ ආයතනයකින් මුදල් ලබාගත්තේ නම්, ඒ කවර ආයතනයකින්ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රතිනිර්මාණ හා සංවර්ධන නියෝජිතායතනය (RADA) වෙත අදාළ රජයේ මුදල් වෙන්කිරීමට අනුමතිය ලබාදුන් නිලධාරීන්ගේ නම් හා තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) රජයේ මුදල් එම ආයතනය වෙත නිකුත් කිරීමට මහා භාණ්ඩාගාරයට හෝ වෙනත් රජයේ ආයතනවලට බලය පැවරුවේ නම්, ඒ කවරෙකු විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත නීත්‍යානුකූල බලය ලබාදුන් ලිපිලේඛන එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0490/'08

15.

ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රතිනිර්මාණ හා සංවර්ධන නියෝජිතායතනය (RADA) මගින් කිලිනොච්චිය, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, වවුනියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කළ නිවාස ව්‍යාපෘතිවල උපදේශකවරුන් හෝ උපදේශක සේවා ආයතන තෝරාගැනීම සඳහා මිල ගණන් කැඳවූයේද;

(ii) ඉහත මිල ගණන් ඉදිරිපත් කළ ආයතනවල නම, ලිපිනය, දුරකථන අංක සහ අදාළ මිල ගණන් කවරේද;

(iii) එම මිල ගණන් අනුමත කළ මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම, තනතුර හා ලිපිනයන් කවරේද;

(iv) ඒ අතුරින් පිළිගත් හෝ අනුමත වූ ආයතනයන්හි නම් හා ලිපිනයන් කවරේද;

(v) අනුමත වූ ආයතන, ප්‍රතිනිර්මාණ හා සංවර්ධන නියෝජිතායතනය (RADA) සමඟ සම්බන්ධීකරණය කළ පුද්ගලයින් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත උපදේශක සේවා සඳහා වැයකළ මුදල එක් එක් දිස්ත්‍රික්කයට හා ව්‍යාපෘතියට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වැයකිරීම් සඳහා අදාළ ඉදිකිරීම් අධීක්ෂණය කළ හා ගෙවීම් අනුමත කළ නිලධාරීන්ගේ නම, තනතුර හා ලිපිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) එම උපදේශක සේවා ආයතන සමග අත්සන් කළ ගිවිසුම් එක් එක් දිස්ත්‍රික්කයට හා ව්‍යාපෘතියට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය,— නාගරික ජනාවාස සංවර්ධනයට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියක් පිහිටුවීම සඳහා ද; තිරසාර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවන බවට සහතිකවීම පිණිස දැනට පවතින නිවාස ඒකක වැඩි දියුණු කිරීම මගින් හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් සහ අවම නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සැලසීම මගින් සේවා පහසුකම් අඩු නාගරික ජනාවාසවල වෙසෙන තැනැත්තන්ගේ ජීවන තත්ත්ව නගාසිටුවීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

### යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 3.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 112,— වැඩසටහන 02,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළහැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් දෙදහස් අටසිය අසූ මිලියන එකසිය අසූ දහස් තුන්සිය තිස් දෙකකට (රු. 2,880,180,332) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 112 — | විදේශ කටයුතු අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 02 — | සංවර්ධන කටයුතු | |
| | | පුනරාවර්තන වියදම් | රු. 401,881,272 |
| | | මූලධන වියදම් | රු.2,478,299,060 |
| | | මුළු වියදම | රු.2,880,180,332 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජූලි මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 3 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සහ 2 එකතුව රුපියල් 318,000,000.

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— කොන්සියුලර් කර්තව්‍ය පනත යටතේ නිවේදනය,— 1981 අංක 4 දරන කොන්සියුලර් කර්තව්‍ය පනතේ 8 වැනි වගන්තිය යටතේ කොන්සියුලර් සේවා සඳහා අය කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2007 ජුනි මස 11 වැනි දින අංක 1501/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008. 02. 05 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*3.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2008 ජනවාරි මස 09 වැනි දින 1531/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.03.04 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*4.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 වැනි දින අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද " 2008 අංක 01 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතු ය.

*5.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ නියමය,— වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ (469 වන අධිකාරය වූ) 2 වැනි වගන්තියේ (5) වැනි උප වගන්තියේ (අ) ඡේදය මගින් පැවරී ඇති බලතල අනුව පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 අප්‍රේල් මස 28 වැනි දින අංක 1547/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

*6.

සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 142,— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දහ අටකට (රු. 18,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| ශීර්ෂය | 142 | — | සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයා | | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන වැඩසටහන | | |
| ව්‍යාපෘතිය | 3 | — | සමාජ සංස්කෘතික ඒකාබද්ධව කටයුතු කිරීම | | |
| | | | පුනරාවර්තන වියදම් | රු. | 18,000,000 |
| | | | මුළු වියදම | රු. | 18,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජූලි මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 4 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 3 දක්වා එකතුව රුපියල් 3,198,180,332.

*7.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*13.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*16.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*17.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*18.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*19.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*20.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 වැනි දින අංක 1544/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*22.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වන වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 වැනි දින අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*23.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 වැනි දින අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධුරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධුරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා නැවත එම ධුරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධුරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමිකය හා දීමනාව, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 80,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. 12,000.00 | මාසික |
| | එකතුව | රු. 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනාව සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව 2004,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2006. 07. 21 වන දින ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2004 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(නිවාස සහ ඉදිකිරීම් පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

*31.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව 2005,— 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය යටතේ 2006.11.24 වන දින ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ 2005 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

32.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

33.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

34.

මහවැලි සංස්කෘතික පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

35.

රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.